# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2004 අංක 10 දරන දේශීය ආදායම් (සමාව දීම විධිමත් කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2004 ඔක්තෝබර් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2004 ඔක්තෝබර් මස 22 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි

# 2004 අංක 10 දරන දේශීය ආදායම් (සමාව දීම විධිමත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2004 ඔක්තෝබර් මස 20 වන දින.]

එල්. ඩී.—ඕ. 14/2004.

ඉවත් කරනු ලබන 2002 අංක 7 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතට සහ 2003 අංක 10 දරන, දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතට අනුකූලව, 2003 අගෝස්තු 31 දින දී හෝ ඊට ප්‍රථම කරන ලද ප්‍රකාශ වෙනුවෙන් ආදායම් බදු නොගෙවීම හෝ ආදායම් බදු ගෙවීමට පවත්නා බැඳීම හෙළිදරව් නොකිරීම සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද සමාව විධිමත් කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද 2003 අංක 10 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත, 2004 අංක 10 දරන දේශීය ආදායම් (සමාව දීම විධිමත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (1) 2003 අංක 10 දරන, දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත, මේ පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මෙයින් ඉවත් කරනු ලැබේ. — 2003 අංක 10 දරන පනත ඉවත් කිරීම.

(2) මේ පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, 2003 අංක 10 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත පැනවීමට පෙරාතුව ම වූ දින, ඉහත කී පනතේ උපලේඛනයේ සඳහන් යම් නීතියක් ප්‍රකාර, යම් බද්දක්, අය කිරීමක් (යම් වරදක් සම්බන්ධයෙන් වූ යම් දණ්ඩන මුදලක් ඇතුළු) දණ්ඩන මුදලක් හෝ දඩයක් ගෙවීමට යටත් වූ හෝ අභිමි කිරීමකට යටත් වූ යම් තැනැත්තකු, ඉහත කී පනතේ විධිවිධාන ප්‍රකාර කරන ලද්දා වූ කිසිවක් හෝ අත්පත් කර ගත් යම් අයිතිවාසිකමක් හෝ නිදහසක් තිබුණේ වුව ද, ඒ නොතකා ඒ බද්ද, අය කිරීම, (යම් වරදක් සම්බන්ධයෙන් වූ යම් දණ්ඩන මුදලක් ඇතුළු) දණ්ඩන මුදලක් හෝ දඩයක් ගෙවීමට යටත් වීම හෝ අභිමි කිරීමකට යටත් වීම හෝ නොකඩව සිදු විය යුතු ය.

3. (1) ආදායම් බදු ගෙවීම සම්බන්ධයෙන් තත්කාලීනව බලපැවැත් වූ නීතිය යටතේ නියමිතව තිබුණ ද 2002 මාර්තු 31 වන දිනට පූර්ව යම් කාල සීමාවක් සඳහා එම බදු ගෙවීමට තමාගේ බැඳීම හෝ 2002 මාර්තු 31 වන දිනට තමාගේ ආදායම් ප්‍රභවයන් හා වත්කම්, කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රකාශ කර නොමැති, ශ්‍රී ලංකාවේ වුව ද, විදේශයක වුව ද සිටින යම් තැනැත්තකු විසින්, 2002 අප්‍රේල් 1 වන දිනට ආදායම් — 2003 අගෝස්තු 31 වන දිනට පූර්වයෙන් කරන ලද ප්‍රකාශ, මේ පනතට අනුකූලව කරන ලද ප්‍රකාශ ලෙස සැලකිය යුතු බව.

2—H 22749—7,050 (2004/08)

බදු ගෙවීමට තමාගේ පවත්නා බැඳීම හෝ වැඩිදුර බැඳීම සහ සියලුම ආදායම් ප්‍රභවයන් හා වත්කම් හෙළිදරව් කරන ප්‍රකාශයක් සහ 2003 අගෝස්තු 31 වන දින දී හෝ ඊට ප්‍රථමයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙතට ඉදිරිපත් කර ඇත්නම්, ඒ ප්‍රකාශය මේ පනත යටතේ කරනු ලැබූ ප්‍රකාශයක් ලෙස සැලකිය යුතු අතර, මේ පනතට අනුකූලව සමාවකට හිමිකම් ලැබිය යුතු ය :

එසේ වුව ද ඉහත දැක්වුණු පරිදි සමාව ලබා දීමේ දී තමා වෙත ලැබී තිබෙන ප්‍රකාශ වල නිවැරදිතාවය කොමසාරිස් ජනරාල්වරයා විසින් සත්‍යායනය කර, අප්‍රකාශිත ආදායම්, අප්‍රකාශිත වත්කම් සහ අප්‍රකාශිත ආදායම් ප්‍රභවයන් හෝ අමතර ආදායම්, වත්කම් සහ ආදායම් ප්‍රභවයන් පිළිබඳව එම ප්‍රකාශවලින් තොරතුරු හෙළිදරව් කරනු ලබන්නේ යම් කොටසකින් ද ඒ කොටස සඳහා පමණක් සමාව ලබා දිය යුතු ය.

(2) සැක දුරු කිරීම පිණිස පහත දැක්වෙන පරිදි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :–

(අ) (i) 2002 අංක 7 දරන, දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ කරන ලද යම් ප්‍රකාශයක්, 2003 අංක 10 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ 11 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ; සහ

(ii) 2003 අංක 10 දරන, දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ කරන ලද යම් ප්‍රකාශයක්, මේ පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව,

මේ වගන්තියේ විධිවිධාන අදාළ වන ප්‍රකාශයක් ලෙස ; සහ

(ආ) 2003 අංක 10 දරන, දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත පිළිබඳව ඇති යම් සඳහනකින්, 2003 අංක 31 දරන, දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි වූ 2003 අංක 10 දරන, දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත අදහස් වන බව හා ඒ සඳහනකට ඒ පනත ඇතුළත් වන බව,

සැලකිය යුතු ය.

(3) සමාව ලබා දිය යුතු ද නැද්ද යන වග තීරණය කිරීමේ දී තමාට ආධාරයක් වීම සඳහා අවශ්‍ය විය හැකි විස්තර හෝ වැඩිදුර විස්තර තමා වෙත සපයන ලෙස, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ තත් කාර්යය

සඳහා ඔහු විසින් බලය පවරන ලද, නියෝජ්‍ය කොමසාරිස් නිලයට පහත් නොවන නිලයක් දරන යම් නිලධරයකු විසින්, ප්‍රකාශ ලැබුණු බව දන්වා ඇත්තේ යම් තැනැත්තන් ගේ ද ඒ තැනැත්තන්ට අවශ්‍ය අවස්ථාවක දී, නියම කරනු ලැබිය හැකි ය. එම විස්තර සපයන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටිනු ලැබූ දින සිට දෙසතියක් ඇතුළත නියමිත ආකෘතියට අනුව එම විස්තර සැපයිය යුතු ය.

කිසිදු විමර්ශනයක් හෝ නඩු පැවරීමක් නොකරන බව.

4. (1) (අ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ 3 වන වගන්තියේ සඳහන් ප්‍රකාශයක් කළ තැනැත්තකු විසින් කරන ලද වරදක් සම්බන්ධයෙන් කිසිදු නඩු පැවරීමක් නොකළ යුතු අතර, ප්‍රකාශයක් කළ තැනැත්තකුට විරුද්ධව, අවස්ථාවෝචිත පරිදි ආදායම් බද්ද, ධන බද්ද හෝ ආදායම් බදු අධිභාරයක් නැතහොත් ධන බදු අධිභාරයක් පැනවීම සඳහා 3 වන වගන්තියට අනුකූලව කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දෙන ලද සමාවට අදාළ වන තාක් දුරට කිසිදු විමර්ශනයක් පැවැත්වීම, තත්කාලීනව බලපවත්නා ඒ හා සම්බන්ධ යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව නොකළ යුතු ය.

(ආ) මේ පනතේ 3 වන වගන්තිය යටතේ සඳහන් පරිදි වූ ප්‍රකාශයක් කර තිබෙන යම් තැනැත්තකුට, 2002 මාර්තු 31 වන දින දී හෝ ඊට පෙර අවසන් වන කාලසීමාව සඳහා කලින් හෙළිදරව් නොකළ යම් ආදායම් හෝ වත්කම් හෙළිදරව් කිරීමක් සම්බන්ධව ගෙවිය යුතු යම් දණ්ඩනයක් ද සමග ආදායම් බදු, ධනබදු හෝ ආදායම් බදු අධිභාර හෝ ධනබදු අධිභාර සම්බන්ධ ගෙවීම් වලින් මුක්තිය ලැබීමට හිමිකම ඇත්තේ ය :

එසේ වුවද, සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බදු අඩුකර ගැනීමට අදාළ, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ XIV පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව, හෝ ඊට අදාළ ඊට පූර්ව වෙනත් යම් නීතියකට අනුකූලව මෙහි ඉහත (අ) සහ (ආ) ඡේදවල සඳහන් බදු හා දණ්ඩන මුදල් ගෙවීමෙන්, කිසි සේවා යෝජකයෙක් නිදහස් නොවන්නේ ය.

(2) 2003 අංක 10 දරන, දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ උපලේඛනයේ සඳහන් යම් නීතියකට අනුකූලව යම් බද්දක්, අයකිරීමක් හෝ (යම් වරදක් හා සම්බන්ධ දණ්ඩන මුදලක් ඇතුළු) දණ්ඩන මුදලක්, අභිමිකිරීමක්, හෝ දඩයක් එකතු කිරීම සහ අයකර ගැනීම ක්‍රියාත්මක කරන කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ වෙනත් යම් අධිකාරියක් විසින් හෝ—

(අ) යථාපරිදි පනවනු ලැබ, ඉහත කී පනතට අනුකූලව පසුව අත්හරිනු ලැබූ, නිදහස් කරනු ලැබූ හෝ අන්‍යාකාරයකින් අයකරනු නොලැබූ එවැනි යම් බද්දක්, අයකිරීමක් හෝ (යම් වරදක් හා සම්බන්ධ දණ්ඩන මුදලක් ඇතුළු) දණ්ඩන මුදලක්, අහිමිකිරීමක් හෝ දඩයක් නියම කරන ලද්දේ ඉහත සඳහන් පනතේ උපලේඛනයේ සඳහන් යම් නීතියකට අනුකූලව ද, ඒ නීතියේ විධිවිධාන සලසා ඇති ආකාරයට ඒ බද්ද, අයකිරීම, දණ්ඩන මුදල, අහිමි කිරීම හෝ දඩය එකතු කර අයකර ගැනීම ; සහ

(ආ) අයවිය යුතු යම් බද්දක්, අයකිරීමක් හෝ (යම් වරදක් හා සම්බන්ධ දණ්ඩන මුදලක් ඇතුළු) දණ්ඩන මුදලක්, අහිමි කිරීමක් හෝ දඩයක් ඉහත සඳහන් පනතේ උපලේඛනයේ සඳහන් යම් නීතියකට අනුකූලව නිදහස් කර හෝ ආපසු ගෙවා ඇති අවස්ථාවක, 2002 මාර්තු 31වන දින හෝ ඊට ප්‍රථම අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා හෝ යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා අවස්ථාවෝචිත පරිදි තක්සේරු දැන්වීම් හෝ වෙනත් යම් නියමයන් නිකුත් කිරීමේ කාලසීමාව ඉකුත් වී තිබුණ ද, අවස්ථාවෝචිත පරිදි ඒ දැන්වීම් හෝ නියමයන් නිකුත් කිරීම,

නීත්‍යානුකූල වන්නේ ය.

(3) මේ පනතට අනුකූලව, කිසිම තැනැත්තකුට, 2003 අංක 10 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ උපලේඛනයේ සඳහන් යම් නීතියකට අනුකූලව ඔහු විසින් ගෙවන ලද හෝ අය කර ගන්නා ලද හෝ අඩු කරගන්නා ලද යම් මුදල්, ඔහුගේ ආදායම හෝ ආදායමෙන් කොටසක් හෝ වෙනුවෙන් ලබා දෙන ලද සමාව හෝ මුක්තිය හේතුවෙන්, ආපසු ගෙවනු ලැබීමකට හෝ 2002 මාර්තු 31 වන දින හෝ ඊට පෙර අවසන් වන යම් කාල සීමාවක් වෙනුවෙන් වූ යම් අලාභයක් ඊට පසුව එළඹෙන යම් වර්ෂයකට ඉදිරියට ගෙන යාමට හිමිකමක් නොමැති විය යුතු ය. එවැනි යම් ආපසු ගෙවීමක දී ආපසු ගෙවිය යුතු මුදල නිශ්චය කිරීමේ කාර්යය සඳහා හෝ එවැනි යම් අලාභයකට ඉඩදීම සඳහා හෝ යම් තැනැත්තකු හිමිකම් කියා සිටින යම් ආපසු ගෙවීමකින් හිලව් කිරීමක් නිශ්චය කිරීමේ කාර්යය සඳහා ඒ තැනැත්තාගේ අප්‍රකාශිත ආදායම් ප්‍රමාණය හෝ අප්‍රකාශිත වත්කම්වල වටිනාකම, ආදායම් බද්දට යටත් ලෙස සැලකිය යුතු ය.

(4) 2003 අංක 10 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ උපලේඛනයේ සඳහන් යම් නීතියකට අනුකූලව, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ යම් බද්දක් එකතු කිරීම හෝ අයකර ගැනීම ක්‍රියාත්මක කරන යම් අධිකාරියක් විසින් පවත්වාගෙන යනු ලැබ තිබී, ඉහත සඳහන් පනතට අනුකූලව නතර කරනු ලැබ, අත්හිටවනු ලැබ හෝ ඉල්ලා අස්කර ගනු ලැබ තිබෙන යම් නඩු කටයුත්තක්, විමර්ශනයක් හෝ පරීක්ෂණයක්, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට එසේ නතර කරනු නොලැබ, අත්හිටුවනු නොලැබ හෝ ඉල්ලා අස්කර ගනු නොලැබ තිබුණ ලෙස, ඒ නඩු කටයුත්ත, විමර්ශනය හෝ පරීක්ෂණය නැවත ප්‍රාණවත් කර හෝ ප්‍රකෘතිමත් කර පවත්වාගෙන යා යුතු ය.

**5**. 3 වන වගන්තියේ සඳහන් යම් ප්‍රකාශයක් ලැබුණු දිනයේ සිට, ඒ ප්‍රකාශය කළ තැනැත්තාගේ අනන්‍යතාව පිළිබඳව සහ ඒ ප්‍රකාශයක අන්තර්ගත යම් කාරණයක් හෝ දෙයක් පිළිබඳව, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් හෝ පරම රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබිය යුතු හා ආරක්ෂා කිරීමට සහාය දෙනු ලැබිය යුතු ය. 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 172 වන වගන්තිය යටතේ, නිල රහස්‍යභාවය කඩ කිරීම සඳහා දඬුවම් ද ඇතුළුව, නිල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට අදාළ ව ඒ පනතේ ඇති සියලු විධිවිධාන, මේ පනත යටතේ කරන ප්‍රකාශ සම්බන්ධව, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය. රහස්‍යභාවය.

**6**. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා බලගැන්වීමේ කාර්යය සඳහා සහ නියෝග සෑදිය යුතු යයි මේ පනතින් නියමිත කාරණ සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය. නියෝග.

(2) ඒ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයෙහි නිශ්චිතව නියම කරන යම් පසු දිනයක දී ක්‍රියාත්මක වන්නේ ය.

(3) ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව ඒ සෑම නියෝගයක් ම අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම, අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ ඊට පූර්වයෙන් කරන ලද කිසිවකට එයින් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලද ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**8**. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම්, මිස-

"වත්කම්" යන්නට, නිශ්චල දේපළ, චංචල දේපළ, බැංකු ශේෂ, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු, කාලය නියමිත තැන්පතු හෝ වෙනත් යම් ආකාරයක තැන්පතු සහ ඇප හෝ ණය වශයෙන් දී ඇති මුදල් සහ අත ඇති මුදල් ඇතුළත් වේ.

"කොමසාරිස් ජනරාල්" යන්නෙහි 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතින් ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

"තැනැත්තා" යන්නට, පුද්ගල මණ්ඩලයක්, සමාගමක් සහ හවුල් ව්‍යාපාරයක් ද ඇතුළත් වේ.

"ආදායම් ප්‍රභවය" යන්නට, මුදලින් හෝ වෙනත් යම් ස්වරූපයකින් ලැබුණු යම් ආදායමක් ඇතුළත් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.